Page 2 July 2010.qxd 22/07/2010 21:00 Page 1




ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

*කර්තෘ* : *දයා ආනන්ද රණසිංහ*
*Editor* : Daya Ananda Ranasinghe
*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## එක්සත් ජාතීන්ගේ අමුතු ජාතියේ වැඩ

**එ**ක්සත් ජාතීන්ගේ මණ්ඩලය යුද අපරාධ ගැන සොයන්නටය කියා ශ්‍රීලංකාවට විශේෂ කමිටු-වක් පත්කර එවන්නට ගත් තීරණයට එරෙහිව ගිය සතියේ කොළඹ ඒ කායඨිලය ඉදිරිපිට අමාත්‍ය විමල් වීරවංශ මහතා උපවාසයයක් ඇරඹූ බවත්, දින දෙකකට පසු ජනාධිපති-වරයාගේ ඉල්ලීම මත වීරවංශ මහතා එම උපවාසය අත්හළ බවත් දැන් කවුරුත් දනිති. විපක්ෂය ද වෙනත් රාජ්‍ය විරෝධී සංවිධාන ද ඒවායේ තොරතුරු මාධ්‍යයන් ද, ලන්ඩනයේ ගාඩියන් පුවත්පතද ඉහතකී උපවාසය විහිළු-වට හා උපහාසයට ලක්කර ලිපි හා අදහස් පුවත් පත්වලද වෙබ් අඩවිවලද පළකර ඇති බව දුටුවෙමු. සමහරුන් කියන්නේ වීරවංශගේ එම ක්‍රියාව විදේශ ජාත්‍යන්තරය වඩාත් අප රටට එරෙහිව උසිගන්වා ගැනීමක් ලෙස ය.

මේ ලියවිල්ලේ අදහස එම සිදුවීමේ හොඳ නරක විග්‍රහකිරීම නොවේ. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ලංකාව කෙරෙහි දක්වන ක්‍රියා පිළිවෙතේ භයානකකම මෙම පත්‍රයේ මුල් පිටුවේ සිට දුවන ප්‍රධාන ලිපියෙන් අපි පැහැදිලි කර ඇත්තෙමු. මේ තීරුවේ අදහස කෙටියෙන් සහ වඩාත් තේරුම් යන ආකාරයට මේ කුට උපායේ සැකැස්ම ගැන ඔබට කියන්නට ය.

කවුරු මොනවා කොයි විදියට කිව්වත් ඇමරිකාව ඇතුළුව ශ්‍රී ලංකා රජය කෙරෙහි අමනාපයෙන් සිටින බටහිර රටවල්වලත් කොටි සංවිධානයේත් බලපෑම පිට එක්සත් ජාතීන්ගේ මණ්ඩලය ශ්‍රීලංකා රජය මානව හිමිකම් උල්ලංඝනය කරමින් යුදඅපරාධ කළ බවට අනියම් වශයෙන් පිළිගෙන තිබේ. දැන් ඔවුන්ගේ උවමනාව ලංකාව කෙසේ හෝ වරදකරුවා කරන්නටමය. දැන් ඔවුන් ඒ සඳහා අවස්ථාවක් සොයමින් සිටී. එක්සත් ජාතීන්ගේ සංවිධානයට මෑතක නවී පිල්ලේ නමැති ද්‍රවිඩ කාන්තාව පත්වූවාට පසු මේ තත්වය වඩාත් උග්‍ර විය. බැංකි මූන් නමැති ඒ සංවිධානයේ ලොක්කා (ලංකාවේ ඔහුට කියන්නේ බකමූන් කියාය. එය ඔහුට වඩාත් ගැළපේ) ලංකා විරෝධී කොටස් වල අතකොළුවක් බවට දැන් පත්ව සිටී.

ඔවුන් දැන් මහන්සිගන්නේ මේ කමිටුව යාප්පුවෙන් ලංකාව ඇතුළට රිංගවන්නට ය. කමිටුව එන්නේ වැරදි සෙවීමේ අදහසින් ම පමණක් බැවින් යම්හෙයකින් ඔවුන් ඇතුල්වුව හොත් වැරදි තිබුණත් නැතත් එකක් නොව දාහක් හදාගෙන යනවා ඇත. කමිටුව පෙන්වන ඒ වැරදි අනුව ඊළඟ පියවර වන්නේ ලංකාව යුද අපරාධ කළ බවට කොටින්ගේ බොරු වීඩියෝ පට ද, බොරු සාක්කි ද ගැට ගසා නඩුව ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයට හදා ගන්නා එකය. එය ජාත්‍යන්තර උසාවියක අසා ශ්‍රීලංකාවේ ජනාධිපති, ආරක්ෂක ලේකම් හා හමුදා ප්‍රධානීන් සියල්ලන්ම යුද අපරාධ කරුවන් බව තීන්දුකර අත්අඩංගුවට ගන්නවා ඇත.

අවුරුදු 30 ක දරුණු යුද්ධයක් නිමාකර මින් දේශයකට සාමය උදාකළ රණ විරුවන් අවුරුද්දකට පසු යුද අපරාධ කරුවන් බවට තීන්දු කෙරෙනවා ඇත. මේලේච්ඡ කොටි ත්‍රස්ත වාදීන් වීරයින් බවට පත්වේ.

# The first Sermon of the Buddha
# ඇසළ මස සිදුකළ ප්‍රථම බුද්ධ දේශනාව



It was the full-moon day of the month of Esala (July), two months after the attainment of Enlightenment, **Gauthama Buddha** thought of delivering his first sermon to some receptive ascetics. Carefully deciding, he went to see his five companions with whom he had practised penances in Uruvela for six years before separating from them.

The place was **Isipathana Migadaya** better known as "**The Deer Park**" in India's **Saranath.**

# Right Livelihood (සම්මා ආජීව)
## The fifth factor in the Noble Eightfold Path

**by Ven: Bhikkhu Payutto**

Right Livelihood is one factor on the Noble Eightfold Path. It is not determined by the amount of material wealth it produces, but rather by the well being it generates. Many Livelihoods which produce a surplus of wealth simply cater to desires rather than providing for any true need.

For the individual, the objective of livelihood is to acquire the four necessities or requisites of human existence: food, clothing, shelter and medicine. Again, the acquisition of these four requisites, be it in sufficient amount or in surplus, is not the ultimate objective. The four requisites are merely a foundation upon which efforts to realize higher objectives can be based.

Some people are content with few possessions and need only a minimum to devote their energies to mental and spiritual development. Others cannot live happily on such a small amount; they are more dependent on material goods. As long as their livelihood does not exploit others, however, Buddhism does not condemn their wealth. Moreover, people who are charitably inclined can use their wealth in ways that are beneficial for society as a whole.

In opposition to contemporary urban values, Buddhism does not measure a person or nation's worth by material wealth. Nor does it go to the opposite extreme, as do Marxist thinkers, and condemn the accumulation of wealth as an evil in and of itself. Instead, Buddhism judges the ethical value of wealth by the ways in which it is obtained, and the uses to which it is put.

**ස**ම්මා ආජීව යනු නිවනට පිවිසෙන්නට ඇති එකම දොරටුව වශයෙන් බුදුන් වහන්සේ දක්වා ඇති අර්ය අෂ්ඨාංගික මාර්ගයේ එක් අංගයකි. නිවනට පිවිසීමේදී මේ අංග අටම සම්පූර්ණ කිරීම අවශ්‍ය වෙයි. සම්මා යන්නෙහි අර්ථය යහපත් සහ නිවැරදි යන්නයි. සම්මා ආජීව යනු ජීවිතය ගෙන යා යුතු යහපත් නිවැරදි පිළිවෙලයි.

යහපත් ජීවිතයක් යනු සමහරුන්ට සැපවත් ජීවිතයකි. ඒ සඳහා මිල මුදල්, වතුපිටි, යාන වාහන හා තවත් බොහෝ දේ අවශ්‍ය බව සිතා ඒ පසුපස යති. ඒ දේ ඉපයීමේදී වැරදි නිවැරදි භාවයක් නොසිතති. එහෙත් සමහරුන්ට සිත සතුටින් ජීවත්වීමට විශාල දේවල් අවශ්‍ය නොවේ. ඔව්හු ලද දෙයින් සතුටට පත්වෙති. මාක්ස් වාදයේ මෙන් ධනය ඉපයීමට බුදුදහම විරුද්ධ නැත. එහෙත් ඒ ධනය ඉපයිය යුත්තේ සූරාකෑමෙන් හෝ කවුරුහෝ හිංසාවට හෝ පමුණුවා නොවේ. ධනය ඇත්තා එය බොහෝ දෙනාගේ යහපත පිණිස යෙදවිය යුතුය.

## ඇසළ මහිම

ගහ කොළ ඉදී ඇහැළෙදි පඩු පැහැය ගැහේ
දළ නල වැදී ඉගිලෙන කොළ බිමට බැහේ
වසන්තයෙදි වූ සිරි මේ මහෙදි නැහේ
අනියත බවේ සළකුණු හැම තැනම දිහේ

බුදු වී වසන්තයෙ සිරි උපරිම දිනක
ජරපත් වෙවී එම සිරි මිය යන මහෙක
අනියත බවට ඇස් ඇර පස්වග සිතක
සදහම් දෙසී බුදු හිමි තුන් ලෝ තිලක

අළුයම හල දොරින් මඳ නල නොපෙනි ඇදී
ගේ තුළ පිරී යන මෙන් නව සිසිල සැදී
ඇස් හළ විටදි සිව්සස් දම් සිතට වැදී
තවුසෙකු නිවන් දුටුවලු මොහඳුරෙන් මිදී

ඇස් හළ ඇහැළ මහ පස්වග තවුසෙ කුගේ
බබළයි ඇහැළ මල් සම්බුදු සිවුර වගේ
සිතුවිලි දුවන විට ඒ මල් සුවඳ දිගේ
බුදු ගුණ සුවඳ නොදැනිම වගෙ සිතට නැගේ

ඇසළෙදි දෙසූ සිවුසස් දහමෙන් පිටත
කිසිවක් බුදු දහමෙ ඉන්පසු දෙසී නැත
මුළු බුදු දහම එම සිවු සස් දහමෙ ඇත
අප හැම සතුය ඒ බුදුදම රකින සිත

දුකත් හේතුවත් නිවනත් මග එයට
ඇත්තේ අපේ සිත තුළමයි සියළු විට
ඇස් හළ විටදි බුදු දහමින් එළිය කොට
දැනගත ඇහැකි වේ එය මැනවින් අපට

♦ *මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*
**Harrow UK**

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**අහිත හිත විචාරශූන්‍ය බුද්ධෙ:**
**ශ්‍රැතිසමයෛර් බහුභිස්තිරස් කෘතස්‍ය**
**උදරභරණ මාත්‍රකෙවලෙච්ඡො:**
**පුරුෂ පශොශ්ච පරොක්ෂ කො විශෙෂ:**

***අර්ථය*** : *වැඩ අවැඩ දෙක පරීක්ෂාකිරීමේ නුවණ නැති, ආගම දහමින් බැහැර වූ, බඩ රැකීම පමණක් කැමති වූ මිනිස් සිව්පාවාගේ ද, සිව්පාවාගේ ද වෙනෙස කවරේද?*

යමෙකුට හොඳ නරක තෝරා බේරා ගැනීමේ බුද්ධිය හෙවත් විචාර බුද්ධිය තිබිය යුතුමය. එය නොමැති නම් ඔහු හෝ ඇය අනිවාර්යයෙන්ම අවුලෙන් වියවුලට පත්වෙනවා නොඅනුමානය. එසේම ඔහුගේ හා ඇයගේ ජීවිතය අධ්‍යාත්මික වශයෙන් පමණක් නොව බාහිර වශයෙන්ද කඩා වැටීමකට බිඳ වැටීමකට ලක්වේ. ඒ නිසා සමාජය තේරුම් ගැනීමට සමාජ සාරධර්ම තේරුම් බේරුම් කරගෙන සදාචාර සම්පන්න වීමට හැම දෙනාටම විචාර බුද්ධිය අවශ්‍යය. සමහර විට අප ව්‍යවහාර බුද්ධිය වශයෙන්ද හඳුන්වන්නේත් එයයි. එනිසා එය සාමාන්‍ය ජීවිතයේදී වැදගත් තැනක් ගනී.


සමහර පුද්ගලයෝ ජීවිතයේ සතුට සොයාගෙන වැරදි මාර්ගවල ගමන්කර සිය ජීවිත අවාසානාවන්ත තත්වයන්ට පත්කර ගනිති. එවන් අයගේ වැරදුණු තැන් යළි නිවැරදි කරගන්නට බැරි තරමට විනාශවී යන්නේය. ඔවුන් සොයාගෙන ගිය සැපත නිසරු බව වැටහෙන්නේ කාලයක් ගිය පසුවය. බොහෝවිට අවසාන වන්නේ පසුතැවීමෙනි. තවත් සමහරු අන් අයගේ වැරදි උපදෙස් පිළිගෙන ඒවා ක්‍රියාත් මක කරන්නට යාමෙන් ජීවිතය අවාසනාවන්ත තත්වයට පත්කරගෙන පීඩා විඳිති. මේ අතර සිටින තවත් කොට්ඨාශයක් නම් තමන් ගතකරන්නේ වැරදි ජීවිතයක් බව දැන දැනම එහි තව දුරටත් ඇලී ගැලී ජීවත්වීමයි. කිසිවිටෙකත් ඉන් මිදී ජීවත්වීමට ඔව්හු උත්සාහ නොකරති. මේ ලෙස ජීවිත අවුල් කරගෙන ජීවත් වන අය කොතෙකුත් අපට පෙනේ. ඒ අන්කිසිවක් නිසා නොව දහමින් ඈත්වූ නිසයි.

ඒ වගේම ජීවිතය අර්ථවත් කරගෙන ජීවිතය සුන්දර කරගෙන සතුටින් සමාදානයෙන් ගතකරන අයද සමාජයේ ජිවත් වෙති. ඔවුන් ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කරන නිසා ඔවුන්ට තමන්ගේ හා අනුන්ගේ ජීවිත වලට ශාප කිරීමට සිදුවන් නේ නැත. හැම මොහොතකම සිනාමුසු මුහුණින් ඔව්හු සියල්ලට මුහුණ දෙති. මීට ප්‍රධාන හේතුව ධර්මයට යොමු වීමෙන් ලැබූ ජීවිතාවබෝධයයි. ධර්මයට නැඹුරුවූ අය සතුටින් ජීවත්වන අතර ඊට පිටුපානා අය පිරිහීමට පත්වෙති.

තවත් කෙනෙක් මුළු ජීවිතයම බඩවියත පෝෂණය කිරීම සඳහා පමණක් කැපකර සිටිති. සාමාන්‍ය ව්‍යවහාරය අනුව එවන් අය ජීවත්වීම සඳහා ආහාර ගන්නවා වෙනුවට ආහාර උදෙසා ජිවත් වෙනවායයි කීවද වරදක් නැත. යුතුකම් ඉටුකිරීම, සුචරිතයෙහි යෙදීම වැනි ගුණධර්ම පසෙක ලා කෑම බීම ගැන පමණක් ළාමක ලෙස සිතන අර්ථශූන්‍ය ජීවිත ඔව්හු ගතකරති.

මෙම කාරණා තුනෙන් යුතුව කටයුතු කරන්නා සහ තිරිසන් සතා අතර එතරම් වෙනසක් නොමැති බව මෙම පද්‍යයෙන් අදහස් කෙරේ. මිනිසෙක් අර්ථවත් වූ ද, වැදගත් වූ ද උතුම් ජීවිතයක් ගතකරන්නට අදහස් කරන්නේ නම් ඔහු ඉහත සඳහන් කාරණා තුනෙන් වෙන්ව කටයුතු කළ යුතු බව ද මින් අවධාරණය කර තිබේ.

♦ **රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
*ලන්ඩන් බෞද්ධ විහාරය*
**London Buddhist Viharaya**
**The Avenue**
**London W4 1UD UK**



**NORMA & Co**
**Associate Solicitors**
**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**
**Any type of Visa Applications**
**Car Accidents**
***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**